# තවත් දුලබ උඩවැඩියා විශේෂයක් වඳවී යාමේ තර්ජනයේ මුවවිටට

සමන්ත ගුණසේකර, රේගු අධිකාරි, ශ්‍රී ලංකා රේගුව

පසුගියදා දකුණු මුහුදුබඩ තීරයේ සිදුකළ නිරීක්ෂණ චාරිකාවක දී ඉතා දුර්ලබ උඩවැඩියා විශේෂයක් ස්වභාවික පරිසරයේ දී දැක ගැනීමේ අවස්ථාව අපට උදාවිය. ඉතා පුදුම සහගත එමෙන් ම වැදගත් සිද්ධියක් වූයේ මෙම පැලෑටිය තිබූ ස්වභාවික පරිසරය වෙරළෙහි සිට මීටර් දහයක් වැනි ඉතා කෙටි දුරකින් පිහිටීමයි.

දේශීය උඩවැඩියා පිළිබඳ හසල දැනුමක් ඇති දොස්තර මලික් ප්‍රනාන්දු මහතා පැවසුවේ මෙම පැලෑටිය ගැන බොහෝ දෙනා නොදක්නා අතර, දන්නා තොරතුරුද අල්ප බවයි. ජියෝඩෝරුථ ඩෙන්සිෆ්ලෝරම් (*Geodoum densiflorum*) නැමැති උද්භිද විද්‍යාත්මක නමින් හඳුන්වන මෙම උඩවැඩියා විශේෂය සඳහා සාමාන්‍ය සිංහල නම හෝ ඉංග්‍රීසි නම සඳහන් ග්‍රන්ථයක් සොයා ගැනීමට කතුවරයාට නොහැකි විය. දේශීය උඩවැඩියා පිළිබඳ තවත් විශේෂඥයකු වන ආචාර්ය සිරිල් විජේසුන්දර මහතාද දොස්තර ප්‍රනාන්දු මහතා මෙන්ම මෙම පැලෑටිය විස්තර කරන ලද්දේ සුවිශේෂී ලක්ෂණ රාශියක් දරන කුතුහලය දනවන සුළු උඩවැඩියා විශේෂයක් ලෙසටය.

මෙය භෞමික උඩවැඩියා විශේෂයක් වන අතර තරමක් විශාල කොළ පැහැති ව්‍යාජ බල්බයකින් පැන නගින පත්‍ර කිහිපයකින් යුක්තය. පත්‍ර ආයත - ලංසාකර හැඩයක් ගන්නා අතර, සමාන්තර නාරටි වින්‍යාසයක් සහිත ව ද දිප්තිමත් කොළ පැහැති වූද පත්‍ර මතුපිට දිස්නයකින් යුක්තය. පොල් වගාව අතර යටි වගාවන් ලෙස තිබූ කොට්ටන් වැනි ශාක අතර තිබූ පඳුරු අතර වියලි පරිසරයකදී ඉතා හොදින් වැඩී තිබුන මෙම පැලෑටිය පෙන්නුම් කරන්නේ තෙත් කලාපීය ශාකයක ලක්ෂණය.

මල් සුදු පැහැති වන අතර, අධරය කහ රෝස පැහැයට හුරුය. පුෂ්ප මඤ්ජරිය තරමක් දිග අක්ෂයක එනම් සෙ. මී. 40-50 පමණ උසට පැනනගියි. කහ පැහැයට හෝ රෝස පැහැයට හුරු මල් ද හමු වූ බවට වාර්තා වී ඇත. මෙහි ඇති විශේෂත්වය වන්නේ පුෂ්ප අක්ෂය දක්ෂිණාවෘත සර්පිලාකාර හැඩයක් ගැනීමයි. පුෂ්ප විවෘතවීම ඇතුලට යොමුවුනු ස්වභාවයක් ගනියි.



*Geodorum densiflorum* (Lam.) Schlechter, redrawn from a drawing in PDA. 1, plant with inflorescence. 2, flower from front

සමාන්‍යයෙන් උඩවැඩියා පුෂ්පයක පරිණත පුෂ්ප සමගම අධාරය $180^0$ කෝණයකින් භ්‍රමනය වෙයි. ඒ පරාග කෘමීන් මගින් සිදුකරවීම පහසුකිරීමටයි. එහෙත් ජියෝඩෝරුම් විශේෂයෙහි විශේෂත්වයක් ලෙස ආධරය ඒ ආකාරයටම භ්‍රමනය වීම අවශ්‍ය නොවන්නේ ඇතුළට වැඩෙන සර්පිලාකාර පුෂ්ප මඤ්ජරිය අක්ෂය මගින් මල පරිනත වෙත්ම නිරායාසයෙන්ම අධාරය පහල අතට යොමු කරවනු ලැබීම නිසයි. සාමාන්‍යයෙන් පුෂ්ප මඤ්ජරියෙහි මල් 10-12 පමණ ප්‍රමාණයක් හට ගනියි. මෙම පැලෑටිය හමු වූ ස්ථානයේ පැල ගණනාවක් මල් කිනිති රාශියක් හටගෙන තිබූ අලංකාර එමෙන්ම දුර්ලභ අවස්ථාවක් නැරඹීමේ වාසනාව කතුවරයාට උදාවිය. මල් හටගැනීම සිදුවන්නේ ජූනි මාසයේ දී ය. යම් කාලයකදී පත්‍ර සියල්ලම මියයාම, මල් වසරක් පාසා හට නොගෙන වසර කිහිපයකට වරක් පමණක් හට ගැනීම වැනි ලක්ෂණ මෙන්ම සවභාවික පරිසර පද්ධති විනාශ වී යාම වැනි කරුණු මෙම පැලෑටිය අප්‍රකට වීමට හේතු වී ඇතැයි සිතිය හැක.

මෙම ස්ථානය වෙත අපව යොමු කරන ලද එසේ ම දේශීය උඩවැඩියා පිළිබඳව සහ ඒවායේ





ව්‍යාප්තිය පිළිබඳව මනා දැනීමක් ඇති එමෙන් මෙම පැලැටිය මෙම අපූරු පරිසරයෙහි ඇති බවට මුලින්ම වාර්ථා කළ, සමන්ත සුරන්ජන් ප්‍රනාන්දු මහතා මෙහිදී ස්තූති පූර්වකව සඳහන් කළ යුතුය.

ලෝක තාක්ෂණ සංගමය මගින් ප්‍රකාශයට පත් කරන ලද, වඳවී යාමේ තර්ජනයට ලක් වූ ශ්‍රී ලංකාවේ පැලැටි සහ සතුන්ගේ 1999 වර්ෂයේ රතු දත්ත පොතෙහි, තර්ජනයට ලක්වූ පැලැටියක් ලෙස මෙම උඩවැඩියාව දක්වා ඇත.

වඩාත්ම ප්‍රකට දේශීය උද්භිද විද්‍යා ග්‍රන්ථය වන ෆ්ලෝරා ඔෆ් සිලෝන්හි, 7 වන වෙළුම මගින් මෙය දුර්ලභ පැලැටියක් ලෙස හඳුන්වා දී ඇති අතර, ග්‍රන්ථය සම්පාදනය කිරීමේ දී රූප සටහන් ඇඳීම සඳහා සජීවී පැලැටියක් සොයා ගැනීම තිබූ අපහසුව නිසාදෝ එම රූපසටහන නිර්මාණය කර ඇත්තේ සංරක්ෂිත නිදර්ශනයක් අනුසාරයෙනි. මෙම පැලැටියෙහි ව්‍යාප්තිය ලෙස එහි දක්වා ඇත්තේ මැද කඳුකරයෙහි පිහිටි නිවර්තන තෙත් වනාන්තර අතර ඇති ශාකවල සෙවන සහිත ස්ථානයන්ය. එහෙත් මෙම පැලැටිය හමු වී ඇති ස්ථාන ලෙස දක්වා ඇත්තේ නුවර දිස්ත්‍රික්කයේ පේරාදෙණිය, හම්බන්තොට දිස්ත්‍රික්කයේ රුගම්තොට සහ රුහුණු ජාතික වනෝද්‍යානයයි. නමුත් මෙරට නිශ්චිත ස්ථාන සඳහන් කර නොමැති අතර, විදේශයන්හි පැලැටිය හමු වී ඇති ස්ථාන සඳහන් කර ඇත.

නමුත් මෙවර මෙම පැලැටිය හමු වී ඇත්තේ දෙවුන්දර ප්‍රදේශයේ මුහුදු වෙරළෙහි සිට මීටර් දහයක් තරම් නුදුරිනි. අදාල පරිසර පද්ධතියේ තිබූ මෙම උඩවැඩියා පැලැටි වලින් වැඩි කොටසක්ම මෙයට වසරක් පමණ ඉහත දී කළුගල් වැඩපලක් සඳහා තනන ලද මාර්ගයක් නිසා විනාශ වී ගොසිනි. ඉතිරි වී ඇති පැල ස්වල්පය ද යෝජිත හෝටල් ව්‍යාපෘතියක් නිසා අද දැඩි තර්ජනයට මුහුණ පා ඇත. මෙම පැලැටි වල ව්‍යාජ බල්බ වල් ඌරන් විසින් උදුරා දමා තිබීමෙන් පෙනී යන්නේ මිනිස් තර්ජනවලට අමතරව සතුන්ගෙන් ද එහිපැවැත්මට තර්ජන ඇති බවයි.

අදාල ස්වභාවික වාසස්ථානය පෞද්ගලික ඉඩමක් අයත් වුවත්, වෙරළ සංරක්ෂණ පනත යටතෙහි ආරක්ෂිත කලාපයට අයත් ප්‍රදේශයක පිහිටා ඇත. නමුත් දින තුන තුළ අප සිදු කළ සංචාරයේ දී දෙවුන්දර රැකව, ආදී ප්‍රදේශවල විවිධ ව්‍යාපාරයන් සඳහා ස්වදේශිකයන් පමණක් නොව විදේශිකයන් විසින් ද මෙම වෙරළ සංරක්ෂණ කලාපය තුළ ඉදිකර තිබූ සහ ඉදිකරගෙන යනු ලබන ස්ථිර ගොඩනැගිලි රාශිය සහ කැස්බෑවන් බිජුලන ස්වභාවික පරිසරය තාප්ප, වැටවල් ආදිය මගින් අවහිර කිරීමෙන් කර ඇති ව්‍යසනය සියැසින් දුටු නිසා මෙම දුලබ උඩවැඩියාවට ද අනාගතයේ දී අත්වන ඉරණම ඉතා පැහැදිලිය. එම නිසා අපූරු ව්‍යාප්තියක් ලෙස විශේෂ වැදගත්කමකින් යුතු වූ මෙම පරිසර පද්ධතිය තුළදී මෙම පැලැටිය සංරක්ෂණය කිරීමට නොපමාව පියවර නොගතහොත් නුදුරු අනාගතයේ දී මෙම අපූරු පැලැටිය අනාගත පරපුරට දැකගැනීමට ලැබෙන්නේ පොත පතින් පමණක් වනවා ඇත.

මෙහි විසඳුම ද ඉතා පැහැදිලිය. මෙම පරිසර පද්ධතිය වෙරළ සංරක්ෂණ පනතට අයත් සංරක්ෂිත කලාපයට අයත් බැවින් එය රැක ගැනීමට අවශ්‍ය විධිවිධාන පහසුවෙන් සිදුකළ හැකිය. යෝජිත හෝටල් ව්‍යාපෘතියෙහි දී එයට සංචාරක ආකර්ෂණයක් වනවා ඇත.

සමන්ත ගුණසේකර
රේගු අධිකාරී
ශ්‍රී ලංකා රේගුව

### විශේෂ ස්තූතිය

පේරාදෙනිය රාජකීය උද්භිද උද්‍යානයේ ආචාර්ය සිරිල් විජේසුන්දර මහතා, වනජීවී ස්වභාව ආරක්ෂක සංගමයේ සභාපති දොස්තර මලික් ප්‍රනාන්දු මහතාටද, ලෝක සංරක්ෂණ සංගමයේ සමන්ත සුරන්ජිත් ප්‍රනාන්දු මහතාට ද මෙම ලිපිය සකස් කිරීමේ දී ලබා දුන් සහයෝගය වෙනුවෙන් කෘතගුණ පූර්වක ස්තූතිය පලකර සිටිමි.

### ආශ්‍රිත ග්‍රන්ථ

දසනායක එම්. ඩී. ෆොස්බර්ග් එෆ්. ආර්. ෆ්ලෝරා සිලෝන් 7 වෙළුම

වඳවී යාමේ තර්ජනයට භාජනය වී ඇති පැලැටි සහ සතුන් 1999 නාමලේඛනය 2000, ලෝක සංරක්ෂණ සංගමය ශාක සිංහල නාම ලේඛනය

බෞද්ධ ඉතිහාසයේ මෙන් ම බෞද්ධ සාහිත්‍යයේ ද සල් වෘක්ෂයට හිමිවන්නේ විශේෂ ස්ථානයකි.